# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 52 — 1973 මාර්තු 23 වැනි සිකුරාද — 1973.03.23**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 365 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 377 |


## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට නම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් “ ඇප තැබීම කළ යුතුය ” යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාමවැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. ඩී. සිරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---


365—බ 70842—16,315 (73/3)
B 1 අ

(iii) තෝරාගනු ලබන අයදුම්කරු විසින් ශ්‍රී ලංකා ජනරජය සමග ගිවිසුමකට එළඹිය යුතුවේ. (රජයේ සේවයෙහි නියුක්ත නොවූවන් ඇපකරුවන් දෙදෙනකු සමග ගිවිසුමකට එළඹිය යුතුය).

(අ) අනිකුත් දේ අතර, නියමිත පුහුණුවීමේ පාඨමාලාව විශ්වාස දායක ලෙසත්, උදෙසාගිමත් ලෙසත් හැදෑරීමටත්, එය සතුටුදායක ලෙස නිමකිරීමටත්, පුහුණුව නිම කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, නියමිත කාල සීමාවකට (පුහුණුව අවසන් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා ජනරජය විසින් නියම කළ යුතු වූ) ශ්‍රී ලංකා ජනරජයට සේවය කිරීමටත් පොරොන්දු වීම හා

(ආ) ගිවිසුමේ වගන්ති හා කොන්දේසි අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් සම්පූර්ණ පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජනරජය හා/හෝ අනිකුත් ප්‍රදානය කිරීමේ ආයතනයක් මගින් දරන ලද පුහුණුවීමේ මූළු වියදම (වැටුප්, දීමනා, නැව් ගාස්තු හා වෙනත් ගාස්තු ආදිය) ආපසු ශ්‍රී ලංකා ජනරජයට ගෙවීමට පොරොන්දු වීම.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—

(i) නාවික නිර්මාණ ශිල්පී.—රු. 7,800—360 × 3—8,880/9,600—360 × 4—480 × 11—රු. 16,320 වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් රු. 9,600 හා රු. 13,920 ට පෙරයි.

(ii) නාවික නිර්මාණ ශිල්පී අභ්‍යාසලාභී.—සියළුම දීමනාවන් ඇතුළත් රු. 300 ක ස්ථිර මාසික දීමනාවක් ගෙවනු ලැබේ. (නාවික නිර්මාණ ශිල්පී අභ්‍යාස ලාභියෙකු, නාවික නිර්මාණ ශිල්පියාට නියමිත වැටුප් පරිමාණය ලැබීමට සුදුසුවන්නේ අවශ්‍ය සුදුසුකම් ලැබීමෙන් හා ඔහු එම තනතුරට පත්කරනු ලැබීමෙන් පසුව පමණි).

4. සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(1) නාවික නිර්මාණ ශිල්පී :

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(ආ) 1973 අප්‍රේල් 25 දිනට වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩිවීම (දැනටමත් රජයේ සේවයෙහි නියුතු නිලධාරීන් සඳහා ඉහත වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) නාවික නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සාමාජිකත්වය (එෆ්. ආර්. අයි. එන්. ඒ.) සමග නාවික නිර්මාණ ශිල්පය පිළිබඳ උසස් ජාතික සහතිකය ; හෝ

(ii) නාවික නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සාමාජිකත්වය (එම්. ආර්. අයි. එන්. ඒ.) සමග උසස් ජාතික සහතිකය ; හෝ

(iii) නිව්පවුන්ඩ්ලන්තයේ ශාන්ත ජෝන් ධීවර නාවික හා සමුද්‍ර ඉංජිනේරු හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ විද්‍යාලය මගින් පිරිනමනු ලබන නාවික නිර්මාණ ශිල්පීය කාර්මික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය.

(2) නාවික නිර්මාණ ශිල්පී අභ්‍යාසලාභී :

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(ආ) වයස අවුරුදු 19 නො අඩු හා අවුරුදු 25 ට නො වැඩි බව ;

(ඇ) භෞතික විද්‍යාව හා ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් සමත් වීම ;

(ඈ) හා දෙවරකට නො වැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන්ට විශිෂ්ඨ සාමාර්ථය සහිතව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 6 කින් සමත් වීම.

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා, ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්. (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු : (1) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො අමුණිය යුතු ය.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම්ටද දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නො ලැබුණු විට ඒ බව වහාම ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුයි.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 13 වෙනි දින,
කොළඹ 3.
ධීවර අමාත්‍යාංශයේ දීය.

**නාවික නිර්මාණ ශිල්පී/නාවික නිර්මාණ ශිල්පී අභ්‍යාසලාභී තනතුර සඳහා ඉල්ලුම් පත් ආකෘතිය**

(සැ. යු. :—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "නාවික නිර්මාණ ශිල්පී/නාවික නිර්මාණ ශිල්පී අභ්‍යාසලාභී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 3, තැ. පෙ. අංක 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.
(1973 අප්‍රේල් 25 දිනට වයස, අවුරුදු :——, මාස :——, දින :——.

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. පාසැලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

(සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය).

9. දැනට කරන රක්ෂාව :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් :————.

11. වෙනත් සුදුසුකම් :————.

ම විසින්, මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් හා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට මා බැඳී ඇති බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-955—73.03.23 දින අංක 52 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත් 1973 අප්‍රේල් මස 10 වෙනි දින හෝ ඊට පෙර, සේවක මණ්ඩල නිලධාරී (රැකියා), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 113, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

3. මෙහි දක්වා ඇති වැටුප් ක්‍රමය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.08.20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දැක්වෙන වගන්තිවලට අනුව අදාල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

5. ඉල්ලුම්පත් ලැබුන බව නොදන්වන අතර, මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවනට අනුකූලව පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. (i) **සේවා කොන්දේසි :**

තෝරාගනු ලබන අපේක්ෂකයින්—

(අ) සිය ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීනත්වයක් සිය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය.

(ඇ) සිය වැටුපෙන් 6% ක් සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක විය යුතුයි. (ඒ සඳහා සංස්ථාව විසින් 9% ක ප්‍රමාණයක් දායක වනු ඇත).

(ඈ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පලාතක සේවය කළ යුතුව ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාලය කට යටත්ව පත්කරනු ලැබේ.

**තනතුර හා වැටුප් ක්‍රමය.**—මෝටර් වාහන විදුලි කාර්මික සී—3

230—310
ශ්‍රේණිය.—රු. ————————
2×5 ; 7×10

**අවශ්‍ය සුදුසුකම්.**—

(අ) මිණුමක 1/32 " පරිමාණයන් කියවීමට සහ භාගික මානයන් සටහන් කර ගැනීමට ද හැකිවිය යුතුයි.

(ආ) වාහනවල විදුලිබල ක්‍රමය පිළිබඳව මනා දැනුමක් සහ ඒ හා සම්බන්ධ වැරදි හරිගස්සා ගැනීමට දැනීමක් තිබිය යුතුයි.

(ඇ) වයර් කිරීම පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුයි.

(ඈ) පරිපත (සර්කිට්) පරීක්ෂා කිරීම ගැන මනා දැනීමක් ද ඇම්මීටර්, වෝල්ට් මීටර් වැනි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳ මනා දැනුමක් ද තිබිය යුතුයි.

(ඉ) පෑස්සීම ගැන හොඳ දැනීමක් තිබිය යුතුයි.

(ඊ) පුහුණුවීමේ කාලයක් සමග යටත් පිරිසෙයින් අවුරුදු 8 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

එන්. ජී. කේ. වෛද්‍යසේකර,
නි. සාමාන්‍යාධිකාරී (පාලන),
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

113, ගාලු පාර, කොළඹ 3.

3–964—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩපල පෝර්මන් තනතුර

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින වැඩපල පෝර්මන් තනතුරු පිරවීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආකෘති පත්‍රය ප්‍රකාර ඉල්ලුම් පත් පිළියෙල කර, කොළඹ 2, තැ. පෙ. 509, වන සංරක්ෂක වෙත 1973 අප්‍රේල් 28 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 4,152—144 × 16—6,456 ක ඒකාබද්ධ වැටුපක් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) වයස අවුරුදු 20 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුයි. (මෙම වයස් සීමාව අන් අයුරකින් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සේවකයන් සඳහා බල නොපවත්වයි.)

(ආ) (i) ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඒ සමාන සහතිකයක් (යාන්ත්‍රික විද්‍යාව හෝ ව්‍යවහාරික ගණිතය හෝ විෂයයන් වශයෙන් ඇති අයට විශේෂ සැළකිල්ලක් දැක්වේ). සහ

(ii) කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ප්‍රායෝගික කාර්මික ආයතනය කණිෂ්ඨ කාර්මික නිලධාරි (යාන්ත්‍රික හෝ විදුලි) සහතිකය හෝ අම්පාර හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ඩිප්ලෝමා (යාන්ත්‍රික හෝ විදුලි) සහතිකය හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයක තුන් අවුරුදු සන්ධ්‍යා කාල යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් සහතිකය.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

5. අයදුම්කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම්පත්වලට ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කළ සහතික පත් භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපනික සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනට මත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතික පත් අනවශ්‍යය.)

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රජයේ සේවයේ පත්වීම්වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම්, ඒවා වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඩබ්. ආර්. එච්. පෙරේරා,
වන සංරක්ෂක.

1973 මාර්තු මස 14,
කොළඹ 2,
තැ. පෙ. 509,
වන සංරක්ෂකගේ කාර්යාලයේදීය.

### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) 1973 අප්‍රේල් 28 දිනට වයස :— අවුරුදු :——, මාස :——.
5. දැනට තනතුරක් දරන්නේ නම්, ඒ කුමක්ද ? :————.
6. අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :————.
7. විශේෂ සුදුසුකම් ඇත්නම්, ඒවා දක්වන්න.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–963—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

### බැංකු සේවයේ I වන ශ්‍රේණියේ තනතුර

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ I වන ශ්‍රේණියේ තනතුරක් සඳහා යෝග්‍ය සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම බැංකුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරෙහි "I වන ශ්‍රේණියේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනු ලියා එවිය යුතුය. බැංකුවේ සේවක මණ්ඩල අංශයට පුද්ගලිකව පැමිණ හෝ තම ලිපිනය ලියූ මුද්දර සහිත කවරයක් සමග ඉල්ලුම් කිරීමෙන් හෝ ඉල්ලුම්පත් ලබාගත හැක. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය 1973. 04. 14 දින වේ.

2. වැටුප් පරිමාණය :

(i) මෙම තනතුර සඳහා මාසික කල්පිත වැටුප් පරිමාණය, රුපියල් 1,250—15×50—රුපියල් 2,000 හා බැංකු පරිමාණ අනුව දීමනා.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරු සුදුසුකම් සහ පළපුරුද්ද අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයකට පත් කරනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්

(i) වයස් සීමාව.—ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

(ii) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.—රජයේ දෙපාර්තමේන්තුවක/රජයේ සංස්ථාවක/පිළිගත් වෙළඳ ආයතනයක/බැංකුවක වගකීම් සහිත තනතුරක් අවුරුදු 7 ක පළපුරුද්දක් ඇති වරලත් ගණකාධිකාරිවරයකු හෝ පිරිවැය හා කළමනාකාරිත්ව ගණකාධිකාරිවරයකු විය යුතුය.

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන්, ලන්ඩන් බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය, බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ වෙනත් සමාන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට සැළකිල්ලක් දක්වනු ලැබේ.

(iii) ඉතා යහපත් චරිතයක් හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

4. සේවා කොන්දේසි :

(1) මෙම තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් රහිතයි.

(2) පත්වීම තුන් අවුරුද්දක පරිවාස කාලයකට යටත් වේ.

(3) තෝරාගනු ලබන අයදුම්කරු බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට, තමාගේ (විවාහක දීමනා හැර) ඒකාබද්ධ වැටුපෙන් 6% ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. මෙයට බැංකුව විසින් ගෙවනු ලබන දායක මුදල සේවකයාගේ ඒකාබද්ධ වැටුපෙන් 9% කි.

(4) තෝරාගනු ලබන අයදුම්කරු දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට තමන්ගේ ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(5) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය ලැබිය යුතුය.

5. අයදුම්කරු විසින් පහත දැක්වෙන ලියකියවිලි පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(1) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය.

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හෝ/හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(3) සුදුසුකම්, චරිතය හා පත්වීමට යෝග්‍යතාවය පිළිබඳ ලබාගත් සහතික.

සැ. යු.—(1) ඉල්ලුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපිගණුදෙනු ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවක මණ්ඩල නිලධාරී වෙත එවිය යුතුය.

(2) තෝරාගත් අයදුම්කරු විසින් දැනට බලපවත්වන නීතිරීති සහ රෙගුලාසිවලට හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර පැනවිය හැකි එවැනි නීතිරීති හා රෙගුලසිවලට අනුකූල විය යුතුය.

සාමාන්‍යාධිකාරී.

1973 මාර්තු 10 දින,
ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
කොළඹ 3.

3–939—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආර්ථික සහායක තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආර්ථික සහායක තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මෙයින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973 අප්‍රේල් 14 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප් පරිමාණය.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය : රු. 4,296—144×16 සහ 180×7—රු. 7,860 කි. රු. 5,448 සහ රු. 6,600 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයන්ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත්තේ ය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරීක්ෂණ කාලයක් පිටය.

4. අවශ්‍ය සුදුසුකම්.—හැම ඉල්ලුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව ;

(ආ) 1973 මාර්තු 24 වැනි දිනට වයස අවුරුදු 23 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව ; (දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ සත්ව පාලනය හෝ ආර්ථික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ උපාධිධරයකු වීම ; නො

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලයක් ඇති ආර්ථික විද්‍යාව විෂයයක් වශයෙන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති තැනැත්තකු වීම ;

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රවලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සහතිකය,

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය, සහ

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

පී. වී. ජිනේන්ද්‍රදාස,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### ආර්ථික සහායක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "ආර්ථික සහායක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පාලන), පේරාදෙණිය" වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
4. ජාතිය :————.
5. විවාහකද අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතික වල පිටපත් ඇමිණිය යුතුයි).
7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
8. මීට කලින් රජයේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.
9. යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.
10. චරිත සහතික වූ ඇති [illegible]යන් තිදෙ[illegible] නම් [illegible] නාම :————.

————,
අත්සන.

දිනය :————.

3–830—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

### පූර්ණකාල උප නේවාසිකාගාර පාලක සහ පුහුණු උද්‍යාන සේවක තනතුරු

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සේවාවේ පූර්ණකාල උපනේවාසිකාගාර පාලක සහ පුහුණු උද්‍යාන සේවක තනතුරු සඳහා මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝරමයට අනුව සකස් කරන ලද අයදුම්පත් 1973 අප්‍රේල් 5 වන දිනට හෝ ඊට පෙර, අතිරේක ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, 202 බෞද්ධාලෝක මාවත, කොළඹ 7 යන ලිපිනයට ලැබෙන සේ ලේඛිත තැපැලෙන් එවිය යුතුය.

**1. පූර්ණකාල උප නේවාසිකාගාර පාලක :**

වැටුප—මාසිකව : (1) රු. 640—8 × 20—රු. 800
(2) රු. 515—7 × 15—රු. 620

**සටහන :** ශිෂ්‍යයින් 500 කට වැඩියෙන් වාසය කරන ශිෂ්‍ය නේවාසිකාගාරවලට පත් කරනු ලබන තැනැත්තන් සඳහා ඉහත (1) හි සඳහන් වැටුප් ක්‍රමයද අනිකුත් තැනැත්තන් සඳහා (2) හි සඳහන් වැටුප් ක්‍රමයද හිමි වේ.

**සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් විය යුතුය. (පරිපාලන පළපුරුද්දක් හා/හෝ ශිෂ්‍ය නිවාස හෝ නේවාසිකාගාර පාලනය ගැන පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ).

වයස.— අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**සටහන :** තෝරාගනු ලබන අයදුම්කරු තමා පත්වීම ලබන ශිෂ්‍ය නේවාසිකාගාරයේම පදිංචි වී සිටිය යුතු අතර, ආහාර හා නැවතීම් ගාස්තු වශයෙන් මසකට ඔහුගෙන් රුපියල් 125 මුදලක් අයකර ගනු ලැබේ.

**2. පුහුණු උද්‍යාන සේවක :**

වැටුප.—මසකට රුපියල් 305—12 × 10—රු. 425.

**අධ්‍යාපන සුදුසුකම්.**—(1) අවම වශයෙන් 7 වන ශ්‍රේණිය සමත් වී සිටිය යුතුය.

(2) පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානයේ හෝ හග්ගල උද්භිද උද්‍යානයේ හෝ ගම්පහ වැනි උද්‍යාන විද්‍යා ආයතනයක උද්‍යාන වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්ද.

මේවා පිළිබඳ දැනුම.—

(i) උද්‍යාන කටයුතු පිළිබඳ මූල ධර්ම.

(ii) සාමාන්‍ය වශයෙන් පැලෑටි වැවීම සහ සාත්තු කිරීම.

(iii) බෝ කිරීමේ ක්‍රම.

(iv) තණ මළු සකස් කිරීම සහ නඩත්තු කිරීම.

(v) සෙවන දෙන සහ දුර්ලභ පැලෑටි බඳුන්වල රෝපනය කිරීම සහ නඩත්තු කිරීම.

(vi) දිය පැලෑටි වගා කිරීම.

වයස.—අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

අතිරේක ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය.

1973 මාර්තු 13 දින දීය.

### ආදර්ශ අයදුම්පත් පෝරමය

............................තනතුර සඳහා අයදුම් පත්‍රය

1. (අ) මුලකුරු සමග නම :————
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය :————.

4. (අ) උපන් දිනය :————.
(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. වෘත්තීය සුදුසුකම් :————.

7. සිංහල පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.

8. ඉංග්‍රීසි පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.

9. පාසැලින් අස් වූ පසු නියුක්ත වූ රැකියාවන් පිළිබඳ විස්තර (කරුණාකර එක් එක් ස්ථානයේ සේවයට බැඳුන හා අස්වුනු දිනයන් සහ එක් එක් ස්ථානයේ දී ලද වැටුප් සඳහන් කරන්න) :————.

10. දැනට දරණ තනතුර, ස්ථානය, වැටුප් ක්‍රමය සහ වැටුප : :————.

11. අයදුම්කරු පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

12. වෙනත් කරුණු :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය වූද නිවැරදි වූද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන්ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවද, පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වරදි ඒවා බව සොයාගනු ලැබුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකිරීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-913—73. 03. 23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## පරමාණු බල මණ්ඩලය

### ලඝු ලේඛක/යතුරු ලේඛක IV වන ශ්‍රේණිය තනතුර (ඉංග්‍රීසි)

වැටුප් පරිමාණය.—රු. 325—7 × 10—රු. 395 මාසිකව (සියලු දීමනා ඇතුළුව).

ඉල්ලුම් පත්‍ර සහ අධ්‍යාපන සුදුසුකම්, සේවා කොන්දේසි ආදිය සභාපති, පරමාණු බල මණ්ඩලය, 46, ග්‍රෙගරි පාර, කොළඹ 7 යන ලිපිනයට තම ලිපිනය සඳහන් මුද්දර ඇලවූ 9" × 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවීමෙන් හෝ පුද්ගලිකව පැමිණ ලබා ගත හැක.

ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය.—1973 අප්‍රේල් මස 15.

3-874—73. 03. 23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

### (ඉංජිනේරු තනතුර)

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පැවරී ඇති නව වගකීම් කාර්යයන් සපුරාලීමට සමත් ඇස්තමේන්තු සම්පාදනය කිරීමෙහි, සැලසුම් කිරීමෙහි සහ ඉදිකිරීම් ව්‍යාපාරයන්හි පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය සඳහන් මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මගින් ශ්‍රී ලංකා පුරවැසියන් විසින් ඉල්ලුම් කළ යුතුය.

ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල සේවයේ යෙදී සිටින අය තම දෙපාර්තමේන්තු/සංස්ථාවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද අනුව වේතනය තීරණය කරනු ඇත.

එස්. බී. සී. හලල්දීන්,
කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.
1973. 03. 09.

3-930—73. 03. 23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : සාප/14/189.

අධ්‍යාපන අමාත්‍යාංශය

**කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු සහ බහුතාක්ෂණික ආයතනයන්හි උප විද්‍යාලයාධිපති තනතුරු**

අධ්‍යාපන අමාත්‍යාංශයේ කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු සහ බහුතාක්ෂණික ආයතනයන්හි උප විද්‍යාලයාධිපති තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973 අප්‍රේල් මස 24 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩකෙළවරේ ''කණිෂ්ඨ කාර්මික ආයතයන්හි විද්‍යාලයාධිපති තනතුරු සහ බහුතාක්ෂණික ආයතයන්හි උප විද්‍යාලයාධිපති තනතුරු'' යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකයන් වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම් ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නෝ නම් තව දුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයේ නියුක්ත වී නැතිනම් මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—රු. 11,040 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 480 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 7 කින් රු. 14,400 දක්වා නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ.

(මීට අනුරූපව, 1969.10.01 දිනට පෙර පැවැති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 8,400—6—480—රු. 11,280 ක් විය.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්කරු විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1973 අප්‍රේල් මස 24 වැනි දිනට තමන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමා අදල නොවේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක පහත සඳහන් විෂයයකින් ලැබූ උපාධියක් තිබීම ;

(i) ඉංජිනේරු විද්‍යාව

(ii) ගණිකය හෝ විද්‍යාව

(iii) වාණිජය

(iv) අර්ථ ශාස්ත්‍රය

(v) කෘෂිකර්මය (කෘෂිකර්මය ප්‍රධාන වශයෙන් ඉගැන්වෙන ආයතන සඳහා පමණකි.)

(ඈ) අවුරුදු 5 ක ඉගැන්වීමේ සහ පරිපාලන පළපුරුද්දක් තිබීම ;

(ඉ) සිංහල භාෂාව ගැන හොඳ දැනීමක් තිබිය යුතුයි. (යාපනයට නම් දෙමළ භාෂාව පිළිබඳ හොඳ දැනීමක් තිබිය යුතුයි.)

සටහන :

(1) කෘෂිකර්මය ප්‍රධාන වශයෙන් ඉගැන්වෙන ආයතන හැර අනිකුත් ඒවා සඳහා ඉංජිනේරු විද්‍යාවෙන් හෝ විද්‍යාවෙන් උපාධි ලැබූවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) විභාග පැවැත්වීම, සහාය කථිකාචාර්යවරුන්, උපදේශකවරුන් ඇතුළු අනිකුත් නිලධාරීන් අතර රාජකාරීන් බෙදදීම, සමීක්ෂණ පැවැත්වීම, වැඩ සටහන්/කාලසටහන් සම්පාදනය කිරීම ආදී කටයුතුවල පරිචයක් ඇතුව අංශයක් භාර කථිකාචාර්ය හෝ ජ්‍යෙෂ්ඨ උපදේශක ධුරයක් දැරීම, පරිපාලනමය/විධායක පළපුරුද්ද ලෙස පිළිගන්නවා ඇත.

(3) දැනටමත් බහුතාක්ෂණික ආයතනයන්හි හා කාර්මික අධ්‍යාපන ආයතනයන්හි සේවය කරන ඉහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

7. ඉල්ලුම් පත්‍ර හෝ ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මේ කාර්යාලයට ලැබුණු බව ඉල්ලුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු සහ බහුතාක්ෂණික ආයතනයන්හි උප විද්‍යාලයාධිපති තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. නම (මුලකුරු සහිතව) :————. මහතා/මහත්මිය/මෙනවිය

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරී ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
(ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? :————.

6. උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර :————.
(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.
(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.
(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
(උ) දෙපාර්තමේන්තුව :————.
(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—(සිංහල/ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතික ද ඇතුලුව)

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

10. වෘත්තීය/සුදුසුකම් පිළිබඳ විස්තර:

| | සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන:

| | ආයතනය | පංතිය | සිට—දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන:

| | ආයතනය | පාඨශාලාව | සිට—දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

13. කලින් දැරූ තනතුරු : (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළියෙලට සඳහන් කරන්න)

| | දෙපාර්තමේන්තුව | ආයතනය/ සේවාස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලික ද? | සිට-දක්වා |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින්, ඔබ වරදකරුවී ඇත්තේද? (එසේ නම්, විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට, එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ?:————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03–828—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

**උප තැපැල් ස්ථානාධිපති ධුරය—අධ්‍යාපන අමාත්‍යාංශය, 'ඒ' ශ්‍රේණිය**

කොළඹ 2, අධ්‍යාපන අමාත්‍යාංශය උප තැපැල් ස්ථානාධිපති ධුරය සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අවම මාසික දීමනාව රු. 75 කි.

අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතු අතර 1973.05.01 වැනි දිනට වයස අවුරුදු 21 ට වැඩි හා 45 ට අඩු විය යුතුයි.

2. අයදුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සභා කොට්ඨාශය තුළ හා යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/උසස් ගණිතය/ව්‍යවහාරික ගණිතය/ගණකාධිකරණය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් තුනකින්වත් සමත්ව සිටිය යුතුයි.

4. ඉල්ලුම් පත් කොළඹ 1, (කොළඹ දකුණ) ප්‍රාදේශීය තැපැල් අධිකාරීතුමාගෙන් ලබාගත් මුද්‍රිත පෝර්මයන්හි එවිය යුතු අතර 1973. 05.01 වැනි දිනට හෝ ඊට පෙර ඔහු වෙත ලැබිය යුතුයි.

අවශ්‍ය වැඩි විස්තර කොළඹ 1, (කොළඹ දකුණ) ප්‍රාදේශීය තැපැල් අධිකාරීතුමාගෙන් ලබාගත හැක.

සී. ජේ. සේරසිංහ,
වැඩබලන පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ.

03–922—73.03.23 දින අංක 52 දරන ගැසට් පත්‍රය

---

**ජාතික කිරි මණ්ඩලය**

**ඇබෑර්තුවක්**

**III වැනි ශ්‍රේණියේ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුර**

කිරි මණ්ඩලීය සේවයේ III වැනි ශ්‍රේණියේ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් පහත සඳහන් ආකාරයට සකස්කර 1973. 04. 10 දින හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. වැටුප් ක්‍රමය.—රු. 1,000—50 × 10—රු. 1,500 මසකට (සියළු දීමනා සමඟ).

3. සුදුසුකම්.—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1973. 04. 10 වැනි දිනට අවුරුදු 40 ට නොවැඩි බව.

(ii) හොඳ කල්ක්‍රියාවෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව.

(iii) (අ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් සමග ඉංජිනේරු වැඩ කටයුතු ගැන යටත් පිරිසෙයින් පස් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම හෝ

(ආ) කාර්මික ඉංජිනේරු වරුන්ගේ (ලන්ඩන්) විභාගයෙන් I වැනි සහ II වැනි කොටස් සමත්වෙමින් ඉංජිනේරු වැඩ කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් පස් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම, හෝ

(ඇ) ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (ලංකා) උපාධිධර සාමාජිකත්වය සමඟ යටත් පිරිසෙයින් පස් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

4. සේවා කොන්දේසි :

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියකු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම භාරගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය උඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හල හොත් මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48 (අ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම

වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 දරන මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවනතුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට මත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, මතුවට පනවන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසියකට අයදුම්කරු යටත්විය යුතුය.

(ඈ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු සමග රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

5. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙකු වේ.

6. ඇප.—තෝරා ගනු ලබන අයදුම්කරු මුදලින් හෝ ඇප මත්පු වකින් රු. 5,000 ක ඇපයක් තැබිය යුතුය.

7. වෛද්‍ය පරීක්ෂණය.—තෝරාගනු ලබන අයදුම්කරු මණ්ඩලයේ වෛද්‍ය නිලධාරී විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

8. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය.)

(ආ) ලබා ඇති ඉහලම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන්/විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයකුගෙන් හෝ මහාචාර්යවරයකුගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතික.

9. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම සභාපති, ජාතික කිරි මණ්ඩලය. තැ. පෙ. 1155, කොළඹ 5, වෙත හැර මණ්ඩලීය සේවයේ අන් කිසිම නිලධාරියකුගේ නමට නො එවිය යුතුය.

සභාපති,
කිරි මණ්ඩලය.

1973 මාර්තු මස 06 වැනි දින,
කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155.
නාරාහේන්පිට,
කොළඹ 5.

ඉල්ලුම් පත්‍රය

III වැනි ශ්‍රේණියේ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුර

1. සම්පූර්ණ නම :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. අයදුම්කරු උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

6. ලබා ඇති උසස්ම වෘත්තීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. සිංහල හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :————.

8. කලින් ලබා ඇති පළපුරුද්ද ගැන විස්තර :—
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

| සේවය කළ ආයතනයේ නම | දැරූ තනතුර | සේවා කාලය ——සිට——දක්වා |
|---|---|---|

9. දැනට කරන රැකියාවේ විස්තර :—

| ආයතනයේ නම | දරන තනතුර | සේවා කාලය ——සිට——දක්වා |
|---|---|---|

10. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් :————

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03–795—73.03.23 දින අංක 52 දරන ගැසට් පත්‍රය

---

ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවක සේවයේ තිබෙන මුස්ලිම් ඇබෑර්තුව පිරවීම සඳහා පහත සඳහන් 4 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති මුස්ලිම් ජාතික පිරිමි අපේක්ෂකයන්ගෙන් පමණක් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. ඇබෑර්තු.—මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ මැතිවරණ කොට්ඨාශයේ ඇති මුස්ලිම් ග්‍රාමසේවක තනතුරේ ඇබෑර්තුව.

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8 (3) (ඊ) ඡේදයේ දක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන් ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත් කරනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. සුදුසුකම් :—

(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය.*

*රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා "ලාංකිකයා" යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනු වෙනි.

(iii) ග්‍රාමසේවකයෙකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන්ද ඇතුළුව අඩු තරමින් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩු තරමින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබා ගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

සටහන.—ග්‍රාමසේවක තනතුරු සඳහා ඉදිරිපත්වන අපේක්ෂකයන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1973 අප්‍රේල් 30 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නො විය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට පූර්ව කිට්ටුම වර්ෂ හයක කාලසීමාව ඇතුලත අපේක්ෂකයාට අකුරණ මැතිවරණ කොට්ඨාශය තුළ අඩු තරමින් වසර තුනක්වත් අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. මෙයට සාක්ෂි වශයෙන් ග්‍රාමසේවකයෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. යාන මූලික ලැයිස්තු, මැතිවරණ ඡන්දදායක ලැයිස්තු වැනි ලියවිලි ද මේ සඳහා ඉදිරිපත් කළ හැකිය ; නැතහොත්

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමඟ කිසිම ලියවිල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටු වල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළ යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තෝරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ. එම ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස එම අපේක්ෂකයන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔවුහු සූදානමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(ඒ) චරිත සහතිකයක්.

**සටහන.**—කිසියම් අපේක්ෂකයෙකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චය කරුවකු, අධිනීතිඥවරයෙකු, නීතිඥවරයෙකු හෝ නොතාරිස්වරයෙකු, ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිලධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරණ එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තකුගෙන් ලබා ගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරන තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන් වී තිබිය යුතු වේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින් තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරීමට හැකි බවටත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරනු ලැබ ඇති විශේෂ සහතිකයක් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි) අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළහැකි කිසියම් අපේක්ෂකයෙකුගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සලකනු ලැබේ.

**සටහන.**—(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදාළවන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡේදය) යටතේ උප්පැන්නයක ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස් කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය. (අදාළ වූ විට)

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතික නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලියකියවිලි උදා : අ. පො. ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම් කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාසල් ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපිය.

(ඊ) ඉහත 4 vi යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන්, සහතික.

(iv) ඉල්ලුම්පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදානමින් තබාගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

11. **අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයෙකු නුසුදුසුයයි ඔප්පු වුවහොත් ඔහු මෙම තනතුරට තෝරාගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කළහොත් හෝ සේවයේ යෙදී සිටින කාලය තුළ ඕනෑම අවස්ථාවකදී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පුවුවහොත් වහාම සේවයෙන් පහ කිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩි ලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

12. **වෛද්‍ය පරීක්ෂණය.**—පත් කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරා ගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම මගේ අභිමතය පරිදි කෙරනු ඇත.

ඇස්. මාරලන්ද,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 මාර්තු මස,
මහනුවර කච්චේරියේ දී ය.

3–965—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### III වෙනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, III වෙනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස, මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1973. 04. 07 වැනි දිනට හෝ ඊට පෙර, කොළඹ 8, කෝට්ටේ පාරේ, ආයුර්වේද කොමසාරිස් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

2. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය, වර්ෂයකට රු. 6,600—180—රු. 8,040 වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1973. 04. 07 වැනි දිනට අවුරුදු 28 ට නොඅඩු බව හා අවුරුදු 45 ට නොවැඩි බව,

(සී) (i) ලංකා පුස්තකාල සංගමයේ මධ්‍යම පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම් ඇති බව,

(ii) රජයේ හෝ වෙනත් පිළිගත් ආයතනයක පුස්තකාලයක අවුරුදු 10 කට නො අඩු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බව,

(iii) සංස්කෘත භාෂාව ගැන දැනීම අමතර සුදුසුකමක් වේ.

5 පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පතට අමුණා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය,

(සී) චරිත සහතික දෙකක්,

(ඩී) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(5) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—අයැදුම්පත් හා අමුණා එවන කිසිම ලියවිල්ලක් ආපසු දෙනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

7. අයැදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් යලිකියවිලි සියල්ලක්ම ආයුර්වේද කොමසාරිස් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු 'කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

වි. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 පෙබරවාරි මස 28 දින,
කොළඹ 8.
කෝට්ටේ පාරේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

III වෙනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා අයැදුම්පත

1. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
(ආ) පෙලපත් නාමය :————.
(ඇ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. (i) උපන් දිනය :————.
(උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුය.)
(ii) 1973 අප්‍රියෙල් මස 7 වැනි දිනට වයස :— අවු :——, මාස :——.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)
5. වෘත්තීය සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)
6. පුස්තකාල කටයුතු ගැන ලබා ඇති පළපුරුද්ද :————.
(ආයතනය, කාලය ආදිය සඳහන් කළ යුතුය. සහතික පිටපත් ඇමිණිය යුතුය.)
7. අයැදුම්කරු ලාංකිකයෙක් ද යන වග :————.
ලාංකිකයෙක් වන්නේ පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද යන වග :————.
8. උපන් ස්ථානය :————.
අයැදුම්කරු :————.
අයැදුම්කරුගේ පියා :————.
අයැදුම්කරුගේ පියාගේ පියා :————.
9. දැනට දරණ තනතුර හා සේවා ස්ථානය :————.
10. මීට කලින් දරන ලද තනතුරු, ඒවා දැරූ වකවානුව හා එයින් අස්වීමට හේතු ආදිය :————.
11. චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනය :—
1. :————.
2. :————.
12. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයැදුම්පතෙහි සඳහන් කරන ලද තොරතුරු නිවැරදි බව ද, සැබෑ බව ද මෙයින් සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බව ද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බව ද මම දනිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-910—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

### අම්පාර දිස්ත්‍රික්කයේ කරවාකු නින්දවූර් පත්තු කොට්ඨාශයේ කල්මුනකුඩි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය

ඉහත සඳහන් ලේකම් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවීම පිණිස අංක 24 හා 1972.9.8 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම මෙයින් අවලංගු කර ඇත.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 මාර්තු මස 09 දින,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

3-841—73.03.23 දින අංක 52 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

1973 අප්‍රේල් සහ ඉන් පසු—වෛද්‍ය අංශයට ඇතුළත්වීම සඳහා විශේෂ අවශ්‍යතා—රසායන විද්‍යාව

වෛද්‍ය විද්‍යා සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාවන්ට ඇතුළත් වීමට අපේක්ෂා කරන සියලුම ශිෂ්‍යයන් රසායන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයෙහි "ඒ" කොටසෙහි සහ "බී" II කොටසෙහි ඇති කාබනික රසායනික විද්‍යා ප්‍රශ්න උදෙසා වෙන් කර ඇති මුළු ලකුණු වලින් යටත් පිරිසෙයින්, සමත් වීමේ මට්ටමට ලකුණු ලබා තිබිය යුතු බව සියලුම පාසැල් ප්‍රධානීන් හා බාහිර විභාගාපේක්ෂකයන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 මාර්තු මස 08 වැනි දින,
කොළඹ 2,
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

3-915—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා හෝටල පාසැල

මතු දක්වෙන පාඨමාලාව පවත්වනු ලැබේ :—

**මත්පැන්හල් සේවා පාඨමාලාව.**—1973 මැයි 2 දින සිට ජූනි 8 දක්වා සතියකට තුන්වරක් සන්ධ්‍යාවන්හි (උපරිම සංඛ්‍යාව 20)

වයස.—අවුරුදු 20—30 අතර (ක්‍රියාත්මක වන දිනය 1973 මැයි 1).

**සුදුසුකම්.**—ගණිතය සහ ඉංග්‍රීසි ඇතිව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සාමාර්ථය. මත්පැන්හලක සේවය කර පළපුරුද්දක් තිබිය යුතුය.

**පාඨමාලා ගාස්තු.**—මසකට රු. 35.

සියළුම විස්තර දක්වෙන අයැදුම් පත්, තමා හැදෑරීමට අපේක්ෂා කරන පාඨමාලාව පැහැදිලි ලෙස දක්වෙන ලියුම් කවරයක බහා, 1973 අප්‍රියෙල් 23 දිනට පෙර, කොළඹ ගාලු මුවදොර මැද පාරේ අංක 25, පිහිටි ලංකා හෝටල පාසැලේ විදුහල්පති වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

3-884—73.03.23 දින අංක 52 දරන ගැසට් පත්‍රය

## සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය—1973

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා වූ සීමිත තරඟ විභාගයක්, විභාග කොමසාරිස් විසින්, 1973 ජූනි මස 2 වැනි දින හා 3 වැනි දින කොළඹ දී පවත්වනු ලැබේ.

2. මෙම විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලබන, සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ ඇබෑර්තු සංඛ්‍යාවක්, එම ඇබෑර්තු පුරවනු ලබන දිනයත්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යථා කාලයේදී තීරණය කරනු ඇත. එම පත්වීම් පිරිනමන අවස්ථාවේදී බලපවත්වන රාජ්‍ය භාෂා රෙගුලාසිවල විධිවිධානයන් යටතේ අපේක්ෂකයින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලබා නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ සහ/හෝ හැසිරීම කරණකොට ගෙන හෝ විභාගයෙන් සමත් වන අපේක්ෂකයින් එක් කෙනෙකුට හෝ ඊට වැඩි ගණනකට හෝ පත්වීම් නොදීමේ අයිතිය, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තබාගනී.

3. **විභාගයට ඉල්ලුම් කළ යුතු පිළිවෙළ.**—(අ) මුද්‍රිත අයදුම්පත් විභාග කොමසාරිස්ගෙන් 1973 අප්‍රියෙල් මස 05 වැනි දින සිට 1973 අප්‍රියෙල් මස 21 වැනි දින දක්වා ලබාගත හැක. එක ඉල්ලුම්කරුවකුට එක ඉල්ලුම් පත්‍රයකට වැඩියෙන් නිකුත් කරනු නොලැබේ. අයදුම් කරුවකු විසින් ලියා ඉල්ලුම් කළ විට, විභාග කොමසාරිස් විසින් මුද්‍රිත ඉල්ලුම්පත්‍රයක් නිකුත් කරනු ලැබේ. මේ සඳහා තමන්ගේ නම සහ ලිපිනය ලියන ලද 9×4 ප්‍රමාණයේ, මුද්දර නොඇලූ කවරයක් ඔහු වෙත යැවිය යුතුය. මෙම කවරයේ උඩ කෙළවරේ "ඉල්ලුම් පත්‍රය—සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා වූ සීමිත තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(ආ) (1) සම්පූර්ණ කරන ලද අයදුම්පත් විභාග කොමසාරිස්, තැ. පෙ. 1503, කොළඹ 2, යන ලිපිනයට, 1973 අප්‍රේල් මස 23 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින්, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර විභාග කොමසාරිස්ට ලැබෙන ලෙස එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑම අයදුම්පතක්ම සෑම අයුරකින්ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර, අයදුම්පතේ ඇති සහතිකය ද අත්සන් කළ යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනය යට නොඑවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ උඩ කෙළවරේ "සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා වූ සීමිත තරඟ විභාගය" යනුවෙන් ද සඳහන් කළ යුතුය.

(ii) ඉල්ලුම් පත්‍ර සියලු ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියලුම තොරතුරු සපයා නොමැති නම්, ඉල්ලුම් පත්‍රය, එහි සඳහන් කර ඇති තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ඇ) (i) විභාගය සඳහා ගාස්තුව රු. 50 කි. මෙම මුදල ආදායම් ශීර්ෂය 6, උප ශීර්ෂය 2, විෂය 5 ට බැර කරන ලෙස උපදෙස් සහිතව, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම ලඟම ඇති කච්චේරියට හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ ගෙවිය යුතුය. කච්චේරියෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් හෝ ලබා ගත් කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට අලවා එවිය යුතුය.

**සටහන.**—කවර හේතුවක් නිසා හෝ විභාගයෙන් ඉල්ලා අස්වන නැතහොත් විභාගයට පෙනී නොසිටින හෝ විභාගයට පෙනී සිටීමෙන් පසුව එසේ පෙනී සිටීමට නුසුදුසුයයි හෙළිවන අපේක්ෂකයෙකුට සිය විභාග ගාස්තුව සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට අයිතියක් නොමැත.

(ii) මෙම විභාගයට පළමුවරට පමණක් අයදුම්පත් ඉදිරිපත් කරන, එනම් සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියට පත්කිරීම සඳහා පෙර අවස්ථාවක පැවැත්වූ සීමිත තරඟ විභාගයට අයදුම්පත් ඉදිරිපත් නොකරන ලද අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුවේ.

(ඉ) අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍රයෙහි වෙන් කර ගැනීමට හැකිවනසේ යොදා ඇති තැපැල් පතෙහි තමන්ගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය ලැබුණු බැව් දැන්වීම සඳහා එය පාවිච්චි කරනවා ඇත. මෙසේ නම සහ ලිපිනය සඳහන් නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා නොඑවනු ඇත. නම සහ ලිපිනය එසේ සඳහන් කළ කිසියම් අයදුම්කරුවකුට තම අයදුම්පත්‍රය ලැබුණු බැව් ඉල්ලුම්පත් බාරගෙන අවසන් කළ දිනයේ සිට සති තුනක් ඇතුළත දන්වා නොඑවනුයේ නම් ඔහු ඒ බැව් වහාම විභාග කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. මෙම විධිවිධානය නොපිළිපැදීමෙන් සමහර විට, විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අයදුම්කරුවන් නොලැබී යාමට ද ඉඩ ඇත.

4. **විභාගයට ඇතුළත් කර ගැනීම.**— (අ) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර, විභාග මධ්‍යස්ථානය භාර පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන, විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින්නාවූ සෑම අපේක්ෂකයකු විසින්ම විභාගය පවත්වන දිනයෙහිදී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත භාරදිය යුතුය. සියළුම විභාගාපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනයේ අග පළවේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

(ඇ) යම්කිසි අපේක්ෂකයකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් හත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම "කොළඹ-2, තැ. පෙ. 1503, විභාග කොමසාරිස්" යන ලිපිනයට දැනුම්දිය යුතුය. (විදුලි පණිවුඩ ලිපිනය, "විභාග, කොළඹ") කියා වේ. ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුය :—

(i) විභාගයේ නම;

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම;

(iii) ලිපිනය:

(iv) තැපැල් කන්තෝරුව, ලියාපදිංචි කළ අංකය සහ අයදුම්පත තැපැල් කළ දිනය.

(ඈ) විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුයි. කෙසේ වුවද, විභාග කොමසාරිස් විසින් ස්වකීය අභිමතය පරිදි, කිසියම් අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට තාවකාලිකව අවසර දිය හැකිය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

5. **සුදුසුකම්.**—සාමාන්‍ය ලිපිකාර සේවයට අයත්, ස්වකීය තනතුරුවල ස්ථිර කරන ලද්දාවූ ද, සාමාන්‍ය ලිපිකාර සේවයේ 1973 පෙබරවාරි 1 වැනි දිනට අවුරුදු 8 කට නොඅඩු සේවයක් සම්පූර්ණ කර ඇත්තාවූද, සේවාවන් සතුටුදායක වූවාවූද නිලධාරීන් මෙම විභාගයේදී තරඟ කිරීමට සුදුසු වනු ඇත.

**සටහන.**—සතුටුදායක සේවා වාර්තාවක් ඇති අපේක්ෂකයින් පමණක් තරඟ කිරීමට සුදුසුකම් ලබනු ඇත. 1973 පෙබරවාරි මස 1 වැනි දිනට පූර්වාසන්නයෙන් වූ අවුරුදු පහක කාලය තුළ ලැබිය යුතු වැටුප් වර්ධකයන් සියල්ලම නියම කාලයේදී ගෙවනු ලැබ ඇත්නම් සහ එම පූර්වාසන්න අවුරුදු පහක කාලය තුළ කවරාකාරයක හෝ කිසිදු විනයානුකූල දඬුවම්වලට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති නම් පමණක් නිලධාරියෙකු සතුටුදායක වාර්තාවක් ඇති අයෙක් ලෙස සලකනු ලබයි. එම පූර්වාසන්න අවුරුදු පහට කලින් වූ කාලය තුළ නිලධාරියාගේ වැඩ හෝ හැසිරීම පිළිබඳව කර ඇති අයහපත් සටහන් හෝ ලබා අති කිසිදු විනයානුකූල දඬුවම් හෝ වෙතොත් ඒවා, සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු පිරිනැමීමේදී, සැළකිල්ලට ගනු ලැබේ. කෙසේ වුවද සිය වෘත්තියේ කවර කාලයකදී වුවද, කිසිදු වංචනික ක්‍රියාවක් හෝ දුරාචාරය හා සම්බන්ධ කිසිදු විෂමාචාර ක්‍රියාවක් හෝ නිසා දඬුවම් පමුණුවා ඇති කිසිම නිලධාරියෙක් මෙම විභාගයේදී තරඟ කිරීමට හෝ තෝරාගනු ලැබීමට හෝ සුදුසුකම් නො ලබයි.

6. **හැඳුනුම් පත්.**—අපේක්ෂකයින් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයන් සඳහා, විභාග ශාලාවේදී, පරිපාලකගේ තෘප්තියට හේතු වන පරිදි, තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් කවරක් වුව පිළිගනු ඇත :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පතක් ;

(ආ) මෙම විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක් ;

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මෙම විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායාරූපය අඩංගු කිසියම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අන් කිසි ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් (අයදුම්කරුගේ අත්සන එහි පසුපිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානයා

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඌවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මාර්තු | ... | 73.03.02 සිකුරාද | ... | 73.02.21 බදාද | දවල් 12.00 |
| | | 73.03.09 සිකුරාද | ... | 73 02 28 බදාද | දවල් 12.00 |
| | | 73.03.16 සිකුරාද | ... | 73.03 07 බදාද | දවල් 12.00 |
| | | 73.03.23 සිකුරාද | ... | 73.03.14 බදාද | දවල් 12.00 |
| | | 73.03.30 සිකුරාද | ... | 73.03.21 බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73.04.04 සිකුරාද | ... | 73.03.28 බදාද | දවල් 12.00 |
| | | 73.04.11 බදාද | ... | 73.04.04 බදාද | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්දා | ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.